# 34

# පාලි සාහිත්‍යයේ 'පණ්ඩිත' ශබ්දය පිළිබඳ විමර්ශනයක්

**බාහිර කථිකාචාර්ය අරුණ කේ. ගමගේ**
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය

පණ්ඩිත යන වචනය පාලි ත්‍රිපිටකයේ විවිධ අයුරින් විවිධ සන්දර්භයන්හි උපයුක්ත වන්නකි.[1] ඒ ඒ සන්දර්භයන්හි දී මෙයට ප්‍රදානය වන අර්ථ ද විවිධ ය. එකී සන්දර්භවලින් විනිර්මුක්ත ව හුදු වාච්‍යාර්ථය පිළිබඳ ව විමසීමේ දී නම් '**පණ්ඩිත**' ශබ්දයට හිමි වන අර්ථය ඉතා සීමිත බව පළමුවෙන් ම සඳහන් කළ යුතු ය.

වර්තමාන සමාජ ව්‍යවහාරයේ **පණ්ඩිත** ශබ්දය බෙහෙවින් ම භාවිත වනුයේ ශාස්ත්‍ර පරිශීලනය කිරීමෙන් උසස් දැනුමක් ලැබූ පුද්ගලයා, නො එසේ නම්, විද්වතා (එනම් ඇති උපාධිධාරියා) වාච්‍ය කිරීමට ය. එසේ ම එය අඥානවන්තයා හෝ අවිධිමත් ලෙස ශාස්ත්‍ර ඥානය පිළිබඳ කිසියම් දැනුමක් ඇත්තා හැඳින්වීමට ද භාවිත වන මුත්[2] ඒ ලේඛනයේ දී නො ව ව්‍යවහාරයේ දී ය. එවන් තැනැත්තා සඳහා **පණ්ඩිතයා** යනුවෙන් භාවිත වන්නේ උත්ප්‍රාසවත් අයුරිනි. ශබ්දය එකක් ම වන නමුදු උච්චාරණය කරනු ලබන රිද්මයෙන් මෙහි අරුත වටහාගත යුතු ය.

මෙහි දී ප්‍රධාන වශයෙන් ම අවධානය යොමු වන්නේ ථේරවාදී බෞද්ධ සම්ප්‍රදායයෙහි **පණ්ඩිත** ශබ්දයට සම්ප්‍රදානය වන අර්ථ භාරය පිළිබඳ ව ය. එසේ නමුදු හුදු ව්‍යාකරණ ශාස්ත්‍රයට හෝ භාෂා විද්‍යාත්මක පක්ෂයට ම නැඹුරු වී එය සිදු කිරීමට මෙහි දී අපේක්ෂා නො කෙරේ. මන්ද යත් එමගින් ලැබිය හැකි අවබෝධය පාර්ශ්වික වන හෙයිනි. එබැවින් අදාළ සන්දර්භය පිළිබඳ සැලකිල්ලට ගනිමින් ම පණ්ඩිත ශබ්දයට හිමි ථේරවාදී අර්ථයන් උත්තානීකරණය කිරීම සඳහා යම් උත්සාහයක් දැරීම මෙහි අභිප්‍රාය යි.

සංස්කෘත සාහිත්‍යයේ **පණ්ඩිත** යන වචනය මෙන්ම **පණ්ඩිත ලක්ෂණ** පිළිබඳ ව ද නොයෙක් විවරණ දක්නා ලැබේ. "ප්‍රශස්ත දෙය ම නිරතුරු සේවනය කිරීමත් සදාචාර විරෝධී වූ ක්‍රියාවන් ගෙන් ඈත් වීමත් පැහැදිලි දර්ශනයෙන් යුක්ත වීමත් පණ්ඩිතයා ගේ ලක්ෂණ බව" මහාභාරතය පවසයි.[3] භගවද් ගීතාව මේ අදහස ම වෙනත් අයුරකින් පැහැදිලි කරයි. පණ්ඩිතයා ගේ ස්වභාවය නම් සියලු සත්ත්වයින් වෙතට මෛත්‍රිය දැක්වීම යි. කුලගෝත්‍ර වශයෙන් හෝ හීන උත්කෘෂ්ට වශයෙන් හෝ විවිධ වූ අසද් මර්යාදාවන් ඔහු ගේ සන්තානයෙහි ක්‍රියාත්මක නො වේ. සකල ලෝකය සමදර්ශනයෙන් ප්‍රේක්ෂණය කිරීම ඔහුගේ ස්වභාවය යි.[4]